| 3 | ඉදි කිරීම් | - | - | - | - | - | - |

* 2012 ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් ඉදිකරන ලද ''මිහිකත මැදුර'' නව ගොඩනැගිල්ලේ තුන්වන මහලේ කාර්යාලය පවත්වා ගෙනයයි.

### 4.4.2 චංචල දේපල

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුල සිදුවන ලද වෙනස් වීම් | | | | | වසර අවසාන යේ දී පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් (+) | මිලදී ගැනීම් (+) | වෙන් දේසි කිරීම් (-) | පවරා දීම් (-) | ඉවත් කිරීම් (-) | |
| 1 | ජංගම දුරකථන | 4 | - | 0 | - | - | - | 4 |
| 2 | ෆැක්ස් යන්ත්‍ර | 20 | - | 3 | - | - | - | 23 |
| 3 | ශීතකරණ | 4 | - | 1 | - | - | - | 5 |
| 4 | මයික්‍රොවේව් උදුන් | 2 | - | - | - | - | - | 2 |
| 5 | Blender | 1 | - | - | - | - | - | 1 |
| 6 | විදුලි කේතල | 19 | - | 3 | - | - | 3 | 19 |
| 7 | කොඩි කණු | 5 | - | - | - | - | - | 5 |
| 8 | බුද්ධ ප්‍රතිමාව | 2 | - | - | - | - | - | 2 |
| 9 | White Board | 15 | - | - | - | - | - | 15 |
| 10 | White Board Stand | 3 | - | - | - | - | - | 3 |
| 11 | UPS | 84 | - | 12 | - | - | 16 | 80 |
| 12 | පරිගණක කට්ටල | 113 | 1 | 15 | 20 | 1 | 4 | 104 |
| 13 | වායු සමීකරණ යන්ත්‍ර | 30 | - | - | - | - | - | 30 |
| 14 | ප්‍රින්ටර | 65 | - | 16 | 12 | - | - | 69 |
| 15 | Cordless Phone | 5 | - | - | - | - | 2 | 3 |
| 16 | රූපවාහිනි යන්ත්‍ර | 11 | - | - | - | - | 1 | 10 |
| 17 | මහජන ඇමතුම් පද්ධතිය | 1 | - | - | - | - | - | - |
| 18 | දවුල | 1 | - | - | - | - | - | 1 |
| 19 | ඩ්‍රම්(බොන්ගො) | 1 | - | - | - | - | - | 1 |
| 20 | Accordion | 1 | - | - | - | - | - | 1 |
| 21 | Cusion visitor chairs | 5 | | | | | | 5 |
| 22 | Sofa Set | 7 | - | - | - | - | - | 8 |
| 23 | Dining Table | 3 | - | 1 | - | - | - | 3 |
| 24 | Dining Chairs | 12 | - | - | - | - | - | 12 |
| 25 | පුස්තකාල කැබිනට් (වානේ) | 3 | - | - | - | - | - | 03 |
| 26 | පුස්තකාල කැබිනට් (දැව) | 11 | - | - | - | - | - | 11 |
| 27 | පුස්තකාල කියවීම් මේස | 02 | - | - | - | - | - | 02 |
| 28 | පුස්තකාල කියවීම් පුටු(රෙක්සින්) | 12 | - | - | - | - | - | 11 |
| 29 | වීදුරු මේස (rounded) | 5 | - | - | - | - | - | 05 |
| 30 | බීරළු පුටු | 12 | - | - | - | - | - | 12 |
| 31 | වානේ අල්මාරි | 27 | - | 3 | - | - | - | 30 |
| 32 | 4 drawer cabinets | 70 | - | 3 | - | - | - | 73 |
| 33 | Executive Table MDF | 7 | - | - | - | - | - | 7 |
| 34 | ලිපි ගොනු රාක්ක | 35 | - | - | - | - | - | 35 |
| 35 | පුටු (රෙක්සින් වානේ) | 3 | - | - | - | - | - | 03 |
| 36 | ලිපිකරු මේස | 24 | - | 3 | - | - | - | 25 |
| 37 | Staff Table | 109 | - | - | - | - | - | 106 |
| 38 | විධායක මේස | 20 | - | - | - | - | - | 20 |
| 39 | Glass pad (විධායක මේස) | 2 | - | - | - | - | - | 02 |
| 40 | පරිගණක මේස | 67 | - | 4 | - | - | - | 71 |
| 41 | කා.කා.ස. මේස (කුඩා) | 8 | - | - | - | - | - | 08 |
| 42 | පරිගණක පුටු | 179 | - | 2 | 5 | - | 20 | 156 |
| 43 | මේස (වානේ) | 1 | - | - | - | - | - | 01 |
| 44 | ලැප්ටොප් පරිගණක | 18 | - | - | - | - | 3 | 15 |

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුල සිදුවන ලද වෙනස් වීම් | | | | | වසර අවසාන යේ දී පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් (+) | මිලදී ගැනීම් (+) | වෙන් දේසි කිරීම් (-) | පවරා දීම් (-) | ඉවත් කිරීම් (-) | |
| 45 | බොයිලේරු | 2 | - | - | - | - | - | 02 |
| 46 | ඡායා පිටපත් යන්ත්‍ර | 15 | - | 4 | - | - | 2 | 17 |
| 47 | ස්පීකර් | 80 | - | - | - | - | - | 80 |
| 48 | විධායක පුටු | 35 | - | 3 | - | - | - | 38 |
| 49 | ඇඳි පුටු | 42 | - | - | - | - | - | 42 |
| 50 | යතුරු ලියන | 2 | - | - | - | - | - | 02 |
| 51 | Water Dispenser ( Hot & Cool) | 4 | - | - | - | - | - | 04 |
| 52 | Water Dispenser (nomal) | 04 | - | - | 1 | - | - | 03 |
| 53 | වතුර ෆිල්ටර් | 01 | - | - | - | - | - | 01 |
| 54 | පාදස්තල විදුලි පංකා | 08 | - | 6 | - | - | - | 14 |
| 55 | පුස්තකාල පොත් | 2134 | - | 86 | - | - | - | 2,220 |
| 56 | පිත්තල පහන | 01 | - | - | - | - | - | 01 |
| 57 | පුස්තකාල කබඩ් (විදුරු) | 07 | - | - | - | - | - | 07 |
| 58 | Dry Box | 01 | - | - | - | - | - | 01 |
| 59 | Dynamic Microphone | 01 | - | - | - | - | - | 01 |
| 60 | Microphone stand | 01 | - | - | - | - | - | 01 |
| 61 | Voice Recorder | 03 | - | - | - | - | - | 01 |
| 62 | Lobby chairs | 65 | - | - | - | - | - | 65 |
| 63 | Small Cassette recorder | 01 | - | - | - | - | - | 01 |
| 64 | Heavy duty staples machine | 05 | - | - | - | - | - | 05 |
| 65 | High back chairs | 02 | - | - | - | - | - | 02 |
| 66 | Visitor Chairs | 135 | - | - | - | - | - | 135 |
| 67 | Medium Back Chairs | 07 | - | - | - | - | - | 07 |
| 68 | Conference Table (Wooden) | 02 | - | - | - | - | - | 02 |
| 69 | Conference Table (Pieces) | 10 | - | - | - | - | - | 10 |
| 70 | Bunk beds | _ | - | - | - | - | - | - |
| 71 | Foam Matress | 04 | - | - | - | - | - | 04 |
| 72 | සේප්පු | 01 | - | - | - | - | - | 01 |
| 73 | මුදල් පෙට්ටි | 02 | - | - | - | - | - | 02 |
| 74 | Conference Chair (low back) | 55 | - | - | - | - | - | 55 |
| 75 | Conference Chair (high back) | 48 | - | - | - | - | - | 48 |
| 76 | Vedio Light & Stand - DC | 01 | - | - | - | - | - | 01 |
| 77 | Vedio Light & Stand - AC | 01 | - | - | - | - | - | 01 |
| 78 | Platform Trolly | 01 | - | - | - | - | - | 01 |
| 79 | Sounds Systems | 02 | - | - | - | - | - | 02 |
| 80 | Multi media Projectors | 5 | - | - | - | 2 | - | 03 |
| 81 | Electrical Screen | 2 | - | 1 | - | - | - | 03 |
| 82 | Display Board | 1 | - | - | - | - | - | 01 |
| 83 | Dry Cabinet | 1 | - | - | - | - | - | 01 |

| අනු අංකය | වත්කම් වර්ගය<br>වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්වය | වර්ෂය තුල සිදුවන ලද වෙනස් වීම් | | | | | 02 වසර අවසාන යේ දී පැවති තත්ත්ව ය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම් (+) | මිලදී ගැනීම් (+) | වෙන් දේසි කිරීම් (-) | පවරා දීම (-) | ඉවත් කිරීම (-) | |
| 84 | Scanners | 5 | - | - | - | - | - | 05 |
| 85 | Non-linear Editing System | 1 | - | - | - | - | - | 01 |
| 86 | රාජ්‍ය ලාංඡනය | 1 | - | 1 | - | - | - | 02 |
| 87 | බුද්ධප්‍රතිමාව තබන කුටීරය | 1 | - | - | - | - | - | 01 |
| 88 | Display Cabinet | 1 | - | - | - | - | - | 01 |
| 89 | 10 KVA Online | 1 | - | - | - | - | - | 01 |
| 90 | Access Control Systems Server Unit | 1 | - | - | - | - | - | 01 |
| | Office Cupboard | 1 | - | - | - | - | - | 01 |
| 91 | දැන්වීම් පුවරු(ඩිජිටල්) | 1 | - | - | - | - | - | 01 |
| 92 | වීඩියෝ කැමරා | 2 | - | - | 1 | - | - | 01 |
| 93 | සාමාන්‍ය කැමරා | 2 | - | - | - | - | - | 02 |
| 94 | Steel Reck | 1 | - | - | - | - | - | 01 |
| 95 | කැබ් රථ | 20 | 2 | - | - | - | - | 22 |
| 96 | ජීප් රථ | 15 | 1 | 1 | - | - | - | 17 |
| 97 | වෑන් රථ | 2 | - | - | - | - | - | 02 |
| 98 | මෝටර් සයිකල් | 1 | - | - | - | - | - | 01 |
| 99 | කාර් රථ | 4 | - | 1 | - | - | - | 05 |
| 100 | ගෑස් කුකර් | 0 | - | 1 | - | - | - | 01 |
| 101 | Hot water Filter | 0 | - | 1 | - | - | - | 01 |
| 102 | Water Tank 500 L | 0 | - | 1 | - | - | - | 01 |
| 103 | වතුර මෝටර් | 0 | - | 1 | - | - | - | 01 |
| **එකතුව** | | **3781** | **4** | **173** | **39** | **4** | **57** | **3,858** |

## 5. සංවර්ධන කටයුතු සඳහා අනෙකුත් අංශයන්ගේ දායකත්වය

## 5.1 ඉඩම් සංවර්ධන හා ඉඩම් ප්‍රතිපත්ති අංශය

රජයේ ඉඩම් ප්‍රශස්ත ලෙස උපයෝජනය කර ගැනීමේ අරමුණින් ජාතික ඉඩම් ප්‍රතිපත්තිවලට අනුකූලව කාලීන අවශ්‍යතාවට ගැළපෙන අයුරින් ඉඩම් නීති සංශෝධනය කිරීම, රජයේ ඉඩම් සංරක්ෂණය, සංවර්ධනය හා කළමනාකරණය කිරීම, පරිසර සමතුලිතතාවය රැකෙන පරිදි විවිධ අංශ අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම, ඒකීය ඉඩම් පරිපාලනයක් දිවයින තුළ පවත්වාගෙන යාම, විවිධ ආයතන හා ජනතාව අතර රජයේ ඉඩම් බෙදාදීම හා බෙදා දී ඇති ඉඩම්වලට හිමිකම් අයිතිය ලබාදීම වැනි කාර්යයන්වල දී අදාළ රාජ්‍ය ආයතන හා නිලධාරීන් සමඟ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම ඉඩම් ගැටළු සඳහා නිවැරදි විසඳුම් ලබාදීම හා ඉඩම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම තුළින් රටේ සංවර්ධනයට දායක වීම, ඉඩම් සංවර්ධන හා ඉඩම් ප්‍රතිපත්ති අංශයේ කාර්යභාරයයි.

එහිදී රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ඉඩම් විෂයට අදාළව ආඥා පනත්, ප්‍රතිපත්ති හඳුන්වා දීම හා සංශෝධනය කිරීම, ඉඩම් නිරවුල් කිරීමේ කටයුතු හා ඉඩම් නිරවුල් කිරීමේ සහතික පත්‍ර නිකුත් කිරීම, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා පළාත් පාලන ආයතන හා රජයේ දෙපාර්තමේන්තු සඳහා අවශ්‍ය ඉඩම් මුදා හැරීම, මහ ගොවි ජනපද, මධ්‍යම පාන්තික ඉඩම්, සීමාසන්න ඉඩම් සඳහා දීමනාපත්‍ර නිකුත් කිරීමේ කටයුතු සංවිධානය කිරීම හා මෙහෙයවීම, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී ඇති විශේෂ ව්‍යාපෘති සඳහා ඉඩම් නිදහස්

කිරීමේ කටයුතු මෙහෙයවීම, ශ්‍රී ලංකාවේ මැනුම් කටයුතු කාර්යක්ෂමව විධිමත්ව සංවිධානය කිරීම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව මෙහෙයවීම, ස්ව කැමැත්තෙන් තොරව අවතැන් වූවන් පුනරුත්තාපනය කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරවීම වැනි කාර්යයන් රාශියක් සිදු කෙරේ.

කාලීන අවශ්‍යතාවයන් හඳුනාගැනීමෙන් පසුව ඉඩම් සංවර්ධන ආඥාපනතට කළයුතු සංශෝධන පිළිබඳ වූ පනත් කෙටුම්පත ගැසට් කිරීමෙන් පසුව පළාත් සභා එකගතාවය නොලැබීම හේතුවෙන් එය යළි කෙටුම්පත්කොට මේ වනවිට නීතිපති නිරීක්ෂණ ලබා ගැනීම සඳහා යොමු කර ඇත. එමගින් විශේෂිත අවස්ථාවන්හි හැර දීමනාපත්‍රවලට අදාළ සියලුම කොන්දේසි ඉවත් කිරිමට තීරණය කොට ඇත. එසේම පසු උරුමය දරුවන්ට පැවරෙන ආකාරය දැක්වෙන පනතේ III උපලේඛනය සංශෝධනය කරමින් ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම සමාන අවස්ථාවන් ඇති කිරිම හා ඉඩම් භුක්ති විඳින තැනැත්තාට ප්‍රමුඛතාවය ලබාදීම වැනි කරුණු හඳුන්වා දීම ද යෝජනා කොට ඇත. එසේම ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත හා ඉඩම් අත්කර ගැනිමේ පනත සංශෝධනය සඳහා අවශ්‍ය පියවර ගනිමින් තිබේ. එමගින් ශ්‍රී ලංකාවේ ගොවි ජනතාවටත් මධ්‍යම පාන්තික හා ගම් පුළුල්කිරීමේ ව්‍යාපාර තුළ ලබා දී ඇති රජයේ ඉඩම්වලට අදාළ කොන්දේසි සංශෝධනය කිරීමෙන් එම ඉඩම් හැකිතාක් දුරට තරඟකාරී වෙළඳපොළ තුළ කටයුතු කිරීම සඳහා විවෘත කිරීමට අපේක්ෂා කෙරේ.

ඉඩම් සංවර්ධන අංශය හා ප්‍රතිපත්ති අංශය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

- ❖ ජාතික ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඉඩම් අණ පනත් කාලීනව සංශෝධනය කිරීම.
- ❖ රජයේ ඉඩම් ආඥා පනත යටතේ පුද්ගලයන් වෙත රජයේ ඉඩම් දීර්ඝ කාලීන බදු මත හා දීමනාපත්‍ර මත ලබා දීම සඳහා ගරු අමාත්‍යතුමාගේ අනුමැතීන් ලබා ගැනීම.
- ❖ දීර්ඝ කාලීන බදුකර හා දීමනාපත්‍ර අතිගරු ජනාධිපතිතුමාගේ අත්සන ලබා ගැනීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යැවීම.
- ❖ දීර්ඝ කාලීන බදු, දීමනාපත්‍ර සම්බන්ධ ගැටළුවලට අදාළව කටයුතු කිරීම.
- ❖ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ගම් නිරවුල් කිරීම් සඳහා ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම.
- ❖ විහාරස්ථාන හා වෙනත් ආගමික ස්ථාන සඳහා පූජා භූමි ඔප්පු හා ප්‍රාරම්භක බදුකර ලබා දීම සඳහා අතිගරු ජනාධිපතිතුමාගේ හා අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කිරිම.
- ❖ සුනාමි වැනි ස්වභාවික විපත් නිසා අවතැන් වූ පුද්ගලයින්ට විකල්ප ඉඩම් ලබා දීම.
- ❖ රජයේ ආයතන සඳහා ඉඩම් පවරා දීම.
- ❖ ජාතික ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඉඩම් අණ පනත් කාලීනව සංශෝධනය කිරීම.
- ❖ විවිධ ඉඩම් ප්‍රශ්න සම්බන්ධව අමාත්‍යාංශයට දිනපතා පැමිණෙන පුද්ගලයන්ගේ ඉඩම් ඉල්ලීම් හා ඉඩම් ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලිපි පිළියෙලකොට අදාළ ආයතන වෙත යොමු කිරීම හා එම ප්‍රගතිය පසු විපරම් කිරීම.
- ❖ ජනාධිපති ලේකම් කාර්යාලයෙන්/ අග්‍රාමාත්‍ය කාර්යාලයෙන්/ අමාත්‍යාංශවලින්/පළාත් සභාවලින්/ මහජනතාවගෙන් ලැබෙන ඉඩම් ඉල්ලීම් හා ඉඩම් ගැටළු සම්බන්ධව කටයුතු කිරීම.
- ❖ විවිධ ඉඩම් ගැටළු සම්බන්ධව ලැබෙන විමසීම්වලට අවශ්‍ය උපදෙස් නියමිත ආයතනවලට යැවීම.
- ❖ ගරු අමාත්‍යතුමා වෙත යොමුවන ඉඩම් ආරවුල් හා අභියාචනා පිළිබඳ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කිරිම.
- ❖ රජයේ ඉඩම් කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් ඉඩම් විෂයට අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා පවත්වා එහිදී මතුවන ගැටළු සම්බන්ධයෙන් උපදෙස් හා විසඳුම් ලබාදීම.
- ❖ දිස්ත්‍රික් සාකච්ඡාවල දී හා මහජන පැමිණිලිවලින් හෙළිදරව් වන ඉඩම් අනවසර අල්ලා ගැනීම් සම්බන්ධයෙන් නීතිමය කටයුතුවලට යොමු කිරීම.

## 2016.01.01සිට 2016.12.31 දක්වා ඉඩම් සංවර්ධන හා ඉඩම් ප්‍රතිපත්ති අංශවල ප්‍රගතිය

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රගතිය |
|---|---|---|
| 01 | 1. ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් ගරු ඇමතිතුමාගේ අනුමැතියට එවා ඇති දීර්ඝකාලීන බදු හා දීමනාපත්‍ර ගොනු සංඛ්‍යාව | 4131 |
| | 2. ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් විමසීම් කරන ලද දීමනාපත්‍ර හා දීර්ඝකාලීන බදු ගොනු සංඛ්‍යාව | 480 |
| | 3. දැනට කටයුතු කරන දීමනාපත්‍ර හා බදු ගොනු සංඛ්‍යාව | 554 |
| | 4. ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලද පසු ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කළ සංඛ්‍යාව | 4884 |
| 02 | 1. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් ලද බදුකර හා දීමනාපත්‍ර සංඛාව (විශේෂ දීමනාපත්‍ර, පූජා භූමි දීමනාපත්‍ර, සුනාමි දීමනාපත්‍ර, රණවිරු දීමනාපත්‍ර) | 1248 |
| | 2. ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිරූප අත්සන සඳහා ජනාධිපති කාර්යාලය වෙත යැවූ බදුකර හා දීමනාපත්‍ර සංඛ්‍යාව | 370 |
| | 3. ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් කරන ලද විමසීම් සංඛ්‍යාව | 691 |
| | 4. දැනට කටයුතු කරන දීමනාපත්‍ර හා බදු ගොනු සංඛ්‍යාව | 27 |
| 03 | 1. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ගරු ඇමතිතුමාගේ අනුමැතියට එවා ඇති නිරවුල් ගොනු සංඛ්‍යාව | 10 |
| | 2. ගරු ඇමතිතුමාගේ අනුමැතියට ඉදිරිපත් කරන ලද නිරවුල් ගොනු සංඛ්‍යාව | 12 |
| | 3. දැනට කටයුතු කරන නිරවුල් ගොනු සංඛ්‍යාව | - |
| 04 | 1. රජයේ විවිධ ආයතනවලට, පළාත් පාලන ආයතන හා ත්‍රිවිධ හමුදාව වෙත ඉඩම් පැවරීම් සඳහා ඉඩම් කොමසාරිස් වෙතින් ලද ගොනු සංඛ්‍යාව | 119 |
| | 2. ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් කරන ලද පැවරීම් සංඛ්‍යාව | 05 |
| | 3. දැනට කටයුතු කරන පැවරීම් ගොනු සංඛ්‍යාව | 11 |
| | 4. ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලද පසු ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කළ සංඛ්‍යාව | 67 |
| | 5. ගරු ජනාධිපති විසින් අනුමැතිය ලබා දී ඇති පැවරීම් සංඛ්‍යාව | 23 |
| 05 | 1. ජනාධිපති කාර්යාලයෙන් ලැබෙන ඉඩම් ගැටලු ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීම් | 120 |
| | 2. අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන ඉඩම් ගැටලු ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීම් | 125 |
| | 3. මහජනයාගෙන් ලැබෙන ඉඩම් ගැටලු ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කිරීම් | 1025 |

## 5.2. ඉඩම් අත්පත් අංශය

රජයේ සංවර්ධන ක්‍රියාවලීන් සඳහා යොදා ගැනීමට අවශ්‍යවන රජයේ ඉඩම් නොමැති අවස්ථාවල දී ඒ සඳහා පෞද්ගලික ඉඩම් අත්කර ගැනීමට 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත හා ඊට අදාළව සංශෝධිත විධිවිධානයන්ට අනුකූලව ඉඩම් අත්කර ගැනීමේ කාර්යභාරය ඉටු කරනු ලබන්නේ මෙම අංශය මගිනි. තවද, සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා කඩිනමින් පෞද්ගලික ඉඩම් රජයට අත්කරදීම සඳහා අවශ්‍ය නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයන් අනුගමනය කිරීම ද රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අත්කරගනු ලබන ඉඩම් සඳහා වන්දි ගෙවීම හා අත්කර ගැනීම් කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී අත්කර ගැනීමේ නිලධාරීන් නියාමනය කිරීම ද මෙම අංශයේ කාර්යභාරය වේ.

වර්තමානයේදී ක්‍රියාත්මක කරන ලද විශාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ඉඩම් අත්කර ගැනීමේ යෝජනා විශාල සංඛ්‍යාවක් මේ වනවිට ලැබී ඇත. එම යෝජනා අතුරින් ජාතික වශයෙන් සුවිශේෂ වැදගත්කමක් උසුලනු ලබන පහත සඳහන් යෝජනා සඳහා ඉඩම් අත්කර ගැනීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් සේ සලකා කටයුතු කරමින් පවතී. තවද පෞද්ගලික ඉඩම් රජයට අත්කර ගැනීමේ දී සියකැමැත්තෙන් තොරව අවතැන්වූවන් නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව අදාළ ආයතන විසින් කටයුතු කිරීම පිළිබඳව නියාමනය කිරීම ද සිදුකරනු ඇත.

1. දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය. (මාතර - හම්බන්තොට දිගුව)
2. මධ්‍ය අධිවේගී මාර්ග ව්‍යාපෘතිය.
3. ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා මාර්ග පුළුල්කිරීම.
4. පේරාදෙනිය - බදුල්ල - චෙන්කලඩි මාර්ග ව්‍යාපෘතිය.
5. මාතර කතරගම නව දුම්රිය මාර්ග ව්‍යාපෘතිය.
6. මොරගහකන්ද / කළුගඟ ව්‍යාපෘතිය.
7. ජලසම්පාදන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
8. වේරුස් ගඟ සංවර්ධන ව්‍යාපෘතිය.
9. විවිධ නාගරික සංවර්ධන ව්‍යාපෘතීන්.
10. යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය
11. මොරාණ ජලාශ ව්‍යාපෘතිය
12. දැදුරුඔය ජලාශ ව්‍යාපෘතිය
13. උමා බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය
14. විවිධ වාරිමාර්ග ව්‍යාපෘතිය
15. විදුලිබල අමාත්‍යාංශය යටතේ විවිධ විදුලිබල ව්‍යාපෘතීන්
16. ගම්පුළුල් කිරීම - නායයාමෙන් හා ගංවතුරෙන් අවතැන්වූවන් සඳහා
17. අමාත්‍යාංශයන්හි අවශ්‍යතාවයන් සඳහා - පාසල්, රෝහල්, ක්‍රීඩාංගන වැනි

2016 වර්ෂය සඳහා සාමාන්‍ය අත්කර ගැනීම් වෙනුවෙන් වන්දි හා පොළී ගෙවීමට මහා භාණ්ඩාගාරය මඟින් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 2345 ක් වන අතර, 2016-12-31 දින වන විට වන්දි හා පොළී ගෙවීම සඳහා රු. මිලියන 1523.94 ක ප්‍රතිපාදන අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට නිකුත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යවා ඇත. ඒ අනුව රු. මිලියන 1427.99 ක මුදලක් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ගෙවීම්කරඇත.

| අනු අංකය | කාරණය | 2 නියමය නිකුත් කිරිම | | 4 නියමය නිකුත් කිරිම | | 5 ප්‍රකාශය නිකුත් කිරිම | | 38 (අ) අතුරු විධානය | | 50, 39 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඉඩම් ප්‍රමාණය හෙක්. | ගොනු ගණන | ඉඩම් ප්‍රමාණය හෙක්. | ගොනු ගණන | ඉඩම් ප්‍රමාණය හෙක්. | ගොනු ගණන | ඉඩම් ප්‍රමාණය හෙක්. | ගොනු ගණන | ගොනු ගණන |
| 1. | වරාය හා මහා මාර්ග කටයුතු | 1,320.4369 | 204 | 90.9291 | 9 | 1,189.5204 | 172 | 1,322.5742 | 161 | 3 |
| 2. | අධ්‍යාපන කටයුතු | 88.7405 | 7 | 0.6519 | 3 | 11.3522 | 1 | 11.6917 | 3 | 5 |
| 3. | ඉඩම් නොමැති ජනතාව සඳහා ඉඩම් බෙදාදීම | 229.58064 | 90 | 47.9269 | 11 | 164.4602 | 38 | 85.3294 | 26 | 7 |
| 4. | මහා පරිමාණ වාරිමාර්ග කටයුතු | 1,673.8386 | 11 | 133.2773 | 7 | 3,502.1423 | 28 | 3,395.6988 | 15 | 1 |
| 5. | පානීය ජල පහසුකම් ලබාදීම | 19.48474 | 66 | 1.0361 | 12 | 227.3485 | 44 | 226.3445 | 31 | 1 |
| 6. | ආරක්ෂක කටයුතු | 64.1748 | 23 | 294.1864 | 16 | 170.8531 | 16 | 24.2812 | 5 | 9 |
| 7. | නාගරික සංවර්ධන කටයුතු | 163.1693 | 21 | | | 55.2877 | 8 | 56.3481 | 8 | 6 |
| 8. | විදුලිය පහසුකම් | 21.22717 | 19 | 8.4999 | 4 | 31.6781 | 7 | 19.4772 | 7 | 1 |
| 9. | අනෙකුත් පොදු කටයුතු සඳහා අත්කර ගැනීම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | **එකතුව** | **3681.96394** | **514** | **632.92681** | **88** | **5724.20324** | **346** | **5077.43021** | **271** | **38** |

Table title: **2016-01-01 දින සිට 2016-12-31 දින දක්වා ඉඩම් අත්කර ගැනීම පිළිබඳ ප්‍රගතිය**

2016 වර්ෂය සඳහා වන්දි හා පොලී ගෙවීමට මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන - රු.මිලියන 2,345

2016 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන - රු.මිලියන 1,523.94

2016 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් වියදම් කරන ලද මුදල - රු.මිලියන1,427.

### 5.3 බිම් සවිය

ශ්‍රී ලංකාවේ ඉඩම් සම්පතෙහි හිමිකම නිරවුල් කර අනාගත පරපුර වෙනුවෙන් සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක වන බිම් සවිය ජාතික වැඩපිළිවෙල ජාතික ආර්ථික සංවර්ධනය හා බැඳී පවතින ඊට ශක්තිමත් පදනමක් දැමිය හැකි වැඩසටහනක් ලෙස හැඳින්විය හැක. ඉඩමේ නිරවුල් අයිතිය තහවුරු කිරිම හා අයිතිකරුවන්ගේ හිමිකම ලියාපදිංචි කිරිම මඟින් ජනතාවට අභිමානවත් ලෙස ජීවත් වීමට ඉඩකඩ සැලසීමත් ඔවුන්ගේ ඉඩම් මනාව සංවර්ධනය කිරිමත් එම ඉඩම් අනාගත ආයෝජන සඳහා යෙදවීම මගින් පුද්ගල සංවර්ධනය ද ඒ තුළින් ජාතික සංවර්ධනය සඳහා දායකත්වය ලබා දීමද මෙම හිමිකම් නිරවුල් කිරිමේ ජාතික වැඩපිළිවෙල හෙවත් බිම් සවිය වැඩසටහන තුළින් ඉටු කරනු ලැබේ.

#### 5.3.1 දැක්ම

ඉඩම් ආරවුලෙන් තොර සමාජයක්

#### 5.3.2 මෙහෙවර

සවිමත් ඉඩම් හිමිකම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සාධනීය දායකත්වයක් ලබා දීම.

#### 5.3.3 අරමුණු

1. ලංකාවේ ඉඩම් ලියාපදිංචිය වඩාත් විශ්වාසනීය, කාර්යක්ෂම, සරල ක්‍රමයකට පරිවර්තනය කිරීම.
2. ඉඩම් ගැටළු, ආරවුල් විසඳීම තුළින් ඉඩම්වල අයිතිය ශක්තිමත් කිරීම.
3. මනා ඉඩම් කළමනාකරණයක් සඳහා වන පරිගණක ගත ඉඩම් තොරතුරු පද්ධතියක් ඇති කිරීම.

#### 5.3.4 කාර්යයන්

බිම් සවිය අංශයේ මූලිකම කාර්යභාරය වන්නේ, රටේ ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරිමෙහි කේන්ද්‍රස්ථානය වශයෙන් ක්‍රියා කිරිමයි. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ අදාළ දෙපාර්තමේන්තු සහ ආයතන සම්බන්ධීකරණ කටයුතු මෙන්ම ප්‍රගති සමාලෝචනය සිදු කිරිම බිම් සවිය අංශයේ කාර්යයන් වේ. මෙම වැඩසටහන සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ඉඩම් හිමිකම් නිරවුල් කිරිමේ දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව දායක වේ. මායිම් පිහිටුවා කඩඉම් සිතියම් සකස් කිරිම මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් ද ඉඩමේ හිමිකම විමර්ශනය කොට එය තහවුරු කර ගැනීමේ කටයුතු ඉඩම් හිමිකම් නිරවුල් කිරිමේ දෙපාර්තමේන්තුව මඟින් ද සිදු කරනු ලබන අතර ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් රජයේ ඉඩම්වලට අදාළ සියළුම කාර්යයන් ඉටු කරමින් දායකත්වය සපයනු ලබයි. රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව ඉඩම් හිමිකම් ලියාපදිංචි කර හිමිකම් සහතික පත නිකුත් කරනු ලැබේ.

#### 5.3.5 බිම් සවිය වැඩසටහනේ ව්‍යාප්තිය

මේ වනවිට බිම් සවිය වැඩසටහන ලංකාවේ දිස්ත්‍රික්ක 18 ක ක්‍රියාත්මක වන අතර රත්නපුර දිස්ත්‍රික්කයෙන් බලංගොඩ, වැලිගෙපොල, කුරුවිට, රත්නපුර, නිවිතිගල, අයගම මහනුවර දිස්ත්‍රික්කයෙන් දොළුව, උඩපලාත, උඩුනුවර, ගඟවටකෝරලේ, හාරිස්පත්තුව, යටිනුවර නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් කොත්මලේ, මාතලේ දිස්ත්‍රික්කයෙන් දඹුල්ල, ගලේවෙල, ගම්පහ දිස්ත්‍රික්කයෙන් දිවුලපිටිය, මීරිගම, මිනුවන්ගොඩ, අත්තනගල්ල, ජාඇල, වත්තල, ගම්පහ, කටාන, දොම්පේ, මහර, අනුරාධපුරයෙන් තඹුත්තේගම, තලාව, රාජාංගනය, නැ.නුවරගම්පලාත, කොළඹ දිස්ත්‍රික්කයෙන් හෝමාගම, මොරටුව, රත්මලාන, කැස්බෑව, දෙහිවල, හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ලුණුගම්වෙහෙර, තිස්සමහාරාමය,හම්බන්තොට, බෙලිඅත්ත, කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් රිදීගම,

පන්නල, කුරුණෑගල, මල්ලවපිටිය, වාරියපොළ, මොණරාගල දිස්ත්‍රික්කයෙන් සියඹලාණ්ඩුව, බදුල්ල දිස්ත්‍රික්කයෙන් මහියංගනය, රිදීමාලියද්ද, පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් මැදිරිගිරිය, හිඟුරක්ගොඩ,කළුතර දිස්ත්‍රික්කයෙන් පානදුර, කළුතර, හොරණ මාතර දිස්ත්‍රික්කයෙන් වැලිගම, මාතර,ගාල්ල දිස්ත්‍රික්කයෙන් ගාල්ල,හික්කඩුව කෑගල්ල දිස්ත්‍රික්කයෙන් ගලිගමුව පුත්තලම දිස්ත්‍රික්කයෙන් වෙන්නප්පුව, පුත්තලම යාපනය දිස්ත්‍රික්කයෙන් නල්ලූර් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 58 ක ක්‍රියාත්මක වේ.

**<u>ඉඩම් ලේඛණ පරිලෝකනය කර පරිගණකගත කිරීමේ වැඩසටහන (E Land registry)</u>**

බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ මූලික හා සවිස්තර විමර්ශනයක් සිදුවන අවස්ථාවන්හීදී ඉඩම් ලේඛන පරිශීලනය මහත් ගැටළුවක් වී ඇත. මේ සඳහා අධික පරිශ්‍රමයක් දැරීමට සිදුවන අතර කාලය හා ශ්‍රමය වැයවන ක්‍රියාවලියක් ලෙස ද හැදින්විය හැක. e - Land Registry වැඩසටහන ක්‍රියාත්මක වීමෙන් මෙම ක්‍රියාවලිය විමර්ශන කටයුතු සිදු කරන නිළධාරින්ට තම කාර්යාලයේ සිට හෝ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පරිගණකය මඟින් හෝ විමර්ශන සඳහා අදාල ලිපිගොනු පරිශීලනය කිරීමේ පහසුකම ලැබේ.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය සහිතව ඉඩම් ලේඛන පරිලෝකනය කර පරිගණකගත (Scanning) කිරීමේ වැඩසටහන ක්‍රියාත්මකවනු ලැබේ. මෙම වැඩසටහනට අනුව දැනට ඉඩම් ලියාපදිංචිකිරීමේ කාර්යාලවල ඇති ඉඩම් ලේඛණ පරිලෝකනය කර විද්‍යුත් ආකෘතියකට අනුව භාවිතා කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව නව ගණුදෙණු සිදුවන අවස්ථාවන්හීදී පරිගණකගත වැඩසටහනට අනුව ගණුදෙනු ලියාපදිංචි කිරීම සිදු කිරීමට නියමිතය.

ඒ අනුව 2016 දී ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල 09 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සම්පත් දායකත්වය ඉඩම් අමාත්‍යාංශය විසින් ලබා දෙන ලදී.

### 5.3.6 2016.01.01 සිට 2016.12.31 දක්වා බිම් සවිය ප්‍රගතිය

| මැනුම් කරන ලද කැඩැස්තර සිතියම් වල ඉඩම් කැබලි සංඛ්‍යාව - මිනින්දෝරු දෙපාර්තමේන්තුව | නිර්දේශ කර අනුමත කරන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව - ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | ලියාපදිංචි කරන ලද හිමිකම් සහතික සංඛ්‍යාව - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | ලබා දුන් දීමනා හා බලපත්‍ර සංඛ්‍යාව - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
|---|---|---|---|
| 133,727 | 60,830 | 35,031 | 18,596 |

**බිම් සවිය වැඩසටහන - මූල්‍ය ප්‍රගතිය**

**2016.01.01 සිට 2016.12.31 දක්වා**

| දෙපාර්තමේන්තුව | 2016 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන ප්‍රමාණය ( රු.මිලියන) | වියදම ( රු.මිලියන) |
|---|---|---|
| මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 250 | 237.9 |
| ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 140 | 90.9 |
| ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 50 | 9.0 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25 | 19.9 |
| ප්‍රධාන කාර්යාලය | 35 | 4.7 |
| **එකතුව** | **500** | **362.6** |

## 5.3.7 චංචල දේපල - 2016

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්ත්වය | වර්ෂය තුළ සිදුවන ලද වෙනස් වීම් | | | | වසර අවසානයේ දී පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කරගැනීම් | මිලදී ගැනීම් | වෙන්දේසි කිරීම් | ඉවත් කිරීම් | |
| 1 | බර වාහන | - | - | - | - | - | - |
| 2 | කැබ් රථ | - | - | - | - | - | - |
| 3 | මෝටර් රථ | - | - | - | - | - | - |
| 4 | වෑන් | - | - | - | - | - | - |
| 5 | ත්‍රීවිලර් | - | - | - | - | - | - |
| 6 | පාගන සයිකල් | - | - | - | - | - | - |
| 7 | ඩුප්ලෝ යන්ත්‍ර | 1 | - | - | - | - | 1 |
| 8 | ඡායා පිටපත් යන්ත්‍ර | 2 | - | - | - | 1 | 1 |
| 9 | පරිගණක | 8 | - | - | - | 4 | 4 |
| 10 | පරිගණක ප්‍රින්ටර්ස් | 2 | - | - | - | 2 | 0 |
| 11 | ලැප්ටොප් පරිගණක | 7 | - | - | - | 3 | 4 |
| 12 | ෆැක්ස් යන්ත්‍ර | 1 | - | - | - | - | 1 |
| 13 | යතුරු ලියන (මැනුවල්) | - | - | - | - | - | - |
| 14 | යතුරු ලියන (ඉලෙක්ට්‍රික්) | - | - | - | - | - | - |
| 15 | සේප්පු | - | - | - | - | - | - |
| 16 | කැමරා | 1 | - | - | - | - | 1 |
| 17 | වීඩියෝ කැමරා | - | - | - | - | - | - |
| 18 | රූපවාහිනී යන්ත්‍ර | 1 | - | - | - | 1 | 0 |
| 19 | රේඩියෝ යන්ත්‍ර | - | - | - | - | | - |
| 20 | ශීතකරණ | - | - | - | - | - | - |
| 21 | ප්‍රොජෙක්ටර් | 1 | - | - | - | - | 1 |
| **එකතුව** | | **24** | **-** | **-** | **-** | **11** | **13** |

## 5.4 පාලන අංශය

- ඉඩම් අමාත්‍යාංශය හා ඒ යටතේ අධීක්ෂණය වන පහත සඳහන් දෙපාර්තමේන්තුවල සියළුම පාලන හා ආයතනික කටයුතු.
  1. මිනින්දෝරු දෙපාර්තමේන්තුව
  2. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
  3. ඉඩම් හිමිකම් නිරවුල් කිරිමේ  දෙපාර්තමේන්තුව
  4. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
  5. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
  6. කන්තලේ සීනි කර්මාන්තායතනය
- අමාත්‍ය මණ්ඩල නිරික්ෂණ හා අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ කටයුතු කිරීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න, මහජන පෙත්සම් කාරක සභා හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභා සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු නඩත්තු කිරීම හා එයට අදාළ ආයතන කටයුතු සිදු කිරීම .
- දේශීය, විදේශීය පුහුණු හා ශිෂ්‍යත්ව සම්බන්ධ සියළුම ආයතන කටයුතු සිදු කිරිම.
- නිලධාරීන්ගේ විනය සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම
- ඉංග්‍රීසි හා දෙමළ භාෂා පරිවර්තන කටයුතු සිදු කිරීම.
- තීරුබදු රහිත වාහන ආනයන කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම .
- තැපැල සම්බන්ධ සියළු කටයුතු පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ සියළුම අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කිරිම.
- අමාත්‍යාංශයේ ප්‍රවාහනය සම්බන්ධ සියළු කටයුතු සිදු කිරිම.

## 5.5 ගිණුම් අංශය

- වාර්ෂික ඇස්තමේන්තු පිළංයෙල කිරිම
- මුදල් පොත හා වැය ලෙජරය නඩත්තු කිරිම
- සියලුම වියදම් දැරීමට අදාළ කටයුතු සිදු කිරිම.
- Pay roll පද්ධතිය ක්‍රියාත්මක කිරිම.
- මාසික ගිණුම් සාරාංශ සැකසීම හා භාණ්ඩාගාරයට යැවීම.
- වාර්ෂික විසර්ජන ගිණුම සකස් කිරිම.
- විගණන විමසුම් ලේඛණය නඩත්තු කිරිම හා රාජ්‍ය ගිණුම් කාරක සභා කටයුතු.
- ගබඩා කටයුතු හා වත්කම් ආරක්ෂා කිරිම.
- භාණ්ඩ සමික්ෂණ කටයුතු.
- ප්‍රසම්පාදන කටයුතු.
- බිම්සවිය හා උගත් පාඩම් ප්‍රතිසංධාන කොමිසම් සභා නිර්දේශ ක්‍රියාත්මක කිරිම, අදාළ ප්‍රතිපාදන  වෙන් කිරිම හා සම්බන්ධිකරණය.
- වාර්ෂික ගිණුම් තුලනය හා වාර්ෂික ගිණුම් පියවීම.

## 5.6 සැලසුම් අංශය

සැලසුම් අංශයේ කාර්යභාරය පහත දක්වා ඇති පරිදි ප්‍රධාන අංග 7 ක් යටතේ සංක්ෂිප්තව පැහැදිලි කෙරේ.

1) අමාත්‍යාංශය වෙනුවෙන්,

- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම
- මධ්‍යකාලීන සැලැස්ම
  වාර්ෂිකව අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාව සඳහා සංවර්ධන වැඩසටහන් පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව සහ
- කාර්ය සාධන වාර්තාව සැකසීම.

2) එම වාර්තා පාර්ලිමේන්තුව, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව ,ජාතික අයවැය දෙපාර්තමේන්තුව, විගණකාධිපති දෙපාර්තමේන්තුව ඇතුළු වෙනත් අදාළ ආයතන වෙත යොමු කිරීම.

3) මාසික ප්‍රගති වාර්තා අනුව කාර්තුමය ප්‍රගති වාර්තා සකසා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වෙබ් අඩවියට ඇතුළත් කිරීම.

4) රජයේ ආයතන සමඟ සැලසුම් කටයුතු සම්බන්ධීකරණය.

5) අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන ජාතික සංවර්ධන වැඩසටහන්වල ක්‍රියාකාරකම් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.

6) ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.

7) ඉඩම් අමාත්‍යංශයේ අවශ්‍යතාවයන් මත ආංශික හා ආයතනික සැලසුම් සකස් කිරීම , එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය ඇගයීම් කටයුතු හා අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීම සඳහා සහාය වීම.

8) පාර්ලිමේන්තුව මගින් කැඳවනු ලබන කෘෂිකාර්මික හා ආංශික කමිටු රැස්වීම් කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## 5.7 නීති අංශය

01. කාලීන අවශ්‍යතා පදනම් කර ගනිමින් පවත්නා ආඥාපනත් සහ පනත් සඳහා ඉදිරිපත් කෙරෙන සංශෝධනයන් අදාළව පනත් කෙටුම්පත් සම්පාදන කටයුතු සඳහා සහය ලබා දීම.

02. අමාත්‍යාංශය නියෝජනය කරමින් ගරු අධිකරණය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම.

03. අවශ්‍ය අවස්ථාවලදී නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය වී කටයුතු සිදු කිරීම.

04. පළාත් ඉඩම් කොමසාරිස්වරුන් හෝ බලයලත් නිළධාරින් විසින් යොමු කරන නඩු කටයුතු මැනවින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අවස්ථාවලදී උපදෙස් ලබාදීම.

05. අමාත්‍යාංශයේ විවිධ අංශ මගින් ඉදිරිපත් කරන නෛතික ගැටළු සම්බන්ධව නිරීක්ෂණ සකස්කිරීම,දැනුවත් කිරීම් සිදුකිරීම .

06. පොදුවේ නීති අංශයෙන් ඉල්ලුම් කරන කටයුතු සඳහා දායක වීම.

ඉඩම් අත්කර ගැනීම්, ඉඩම් සංවර්ධන කටයුතු සහ පරිපාලන කටයුතුවලට අදාළව 2016 වර්ෂයේ ලැබී ඇති නඩු හා දැනට අවසන් වී ඇති නඩු

| **2016 වර්ෂය සඳහා ලැබී ඇති නඩු** | **සංඛ්‍යාව** | **2016 වර්ෂයේ අවසන් වූ නඩු සංඛ්‍යාව** |
|---|---|---|
| ඉඩම් අත්කර ගැනීම්වලට අදාළව | 22 | 07 |
| ඉඩම් සංවර්ධන කටයුතුවලට අදාළව | 11 | 03 |
| පරිපාලන කටයුතුවලට අදාළව | 11 | - |

## 5.8 අභ්‍යන්තර විගණන අංශය.

- ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ අභ්‍යන්තර විගණන අංශය කටයුතු කරනු ලබයි
- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තුවල පාලන පද්ධති හා විශ්වාසනීය මූල්‍ය වාර්තාවන් සකස් කිරීම සහතික වීම සඳහා ඇගයීම් සිදුකර, වැඩිදියුණු කිරීම් යෝජනා කිරිමට මෙම අංශය කටයුතු කරනු ලබයි.
- 2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන පරීක්ෂණ 25 ක් සිදු කර ඇති අතර, මේ සඳහා පසු විපරම්ද සිදු කර ඇත.

| **විගණන විමසුම ඉදිරිපත් කළ ආයතනය** | **විගණන විමසුම් ගණන** |
|---|---|
| ඉඩම් අමාත්‍යාංශය | 07 |
| ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | 06 |
| ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 07 |
| ඉඩම් මැනුම් සභාව | 05 |
| **එකතුව** | **25** |

- එමෙන්ම අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්, දෙපාර්තමේන්තු හා ඉඩම් මැනුම් සභාවේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පවත්වා ඇත.